

## Sri Lanka's 61st Independence

In the Indian Ocean of Sri Lanka
Known as the **Pearl of the East**
In this land of great tea….
There lies celebration and feast
What celebration is this ?
On February 4th you may ask
What is this ?
It's very very important task….


Patriot heroes protested
Against the colonial rule
Their voice was not wasted
When the British finally gave up
And the Victory was tasted…
As the Economy was changed
The beauty wasn't touched
Sparkling rivers and lakes
That you'll enjoy very much….

Still if you think you will ponder
What celebration is this
you still wonder ?

This celebration is Sri Lanka's
61st Independence you see
So Jump and Shout
and Yell with glee…

While you shout, yell,
and jump with glee
Wish Peace and tranquilty
in this wonderful land be

♦ **Ravindu Ranawaka**
**10 years**
**Simi Valley, CA, USA**




## The birth of paper කඩදාසියේ උපත

The word paper is derived from the reedy plant papyrus., which grows along the Nile River. Sheets made from papyrus fibres dampened, pressed and so cemented together, were used as writing material in ancient times, and many papyrus records still survive.

Papermaking can be traced to about AD 105 in China. The art traveled slowly westward, reaching Samarkand in 751 and Baghdad in 793. By the 14th century a number of paper mills existed in Europe. Invention of printing in the 1450s brought a vastly increased demand for paper. The work was done largely by hand making one sheet at a time. In 1798 mechanised papermaking industry came into being. පැපිරස් නමැති බට වර්ගයේ පැළයක කොළ පොහවා සියුම්ව තලා ඒවා ලියන කඩදාසි ලෙස පැරැණ්නෝ භාවිතා කළහ. Paper යන වචනය බිඳී ආවේ පැපිරස් යන වචනයෙනි. පැපිරස් වැවෙන්නේ නයිල් ගඟ අසබඩය. ක්‍රි. ව. 105 දී චීනයේ කඩදාසි භාවිතා කළ බව කියති. 14 වන සිය වසේ දී යුරෝපයේ කඩදාසි කම්හල් ඇති විය. 1450 දී මුද්‍රණ ශිල්පයේ සම්භවයත් සමග කඩදාසි සඳහා වූයේ ඉමහත් ඉල්ලුමකි. මුලින් අතින් එක බැගින් තැනූ කඩදාසිය 1798 දී විශාල ලෙස නිපදවන කම්හල් ඉදිවිණ.

♦ ***Auntie Ramani* - රමණි නැන්දා**

### සිහිනය

කුරුළු පිහාටුවක නැගී
අහසේ පාවී ගියා තනිව
එහි අරුම ලෝකයකි
නිහඬයි අලංකාරයි

හඳට එබිකම්කර
තාරකාවක් අරන් පියාඹා
දුහුල් වලාවෙහි සැතපුණා
හද තිගැස්සුණා
නෙත් ඇහැරුණා
වැටහුණා සැම වැටහුණා
මා සැබෑ ලොවට පැමිණියා

♦ ***අනුරුද්ධිකා ලක්මාලි ප්‍රේමරත්න***
**සංඝබෝධි මැදි මහ විදුහල**
**මිනිපෙSri Lanka**

ලංකා බැංකුව
BANK OF CEYLON
ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි
ලන්ඩන් ශාඛාව

වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC** ගිණුමක් අරඹන්න !
*උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !*

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගත-කර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දි එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදි මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණීය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**

## පොතක් දොරට වැඩිය දා

## පද්මා කුරුප්පු ලියූ අළුත්ම නවකතාව




ලේඛක කේ. ජයතිලක මහතාට පොත පිළිගන්වයි

**ප්‍රං**ශයේ පැරිස් නුවර වෙසෙන ප්‍රකට ලේඛිකාවක හා කිවිඳියක වන පද්මා කුරුප්පු මහත්මිය විසින් ලියන ලද **සත්‍යාංගනා** නම් වූ නවතම නවකථාව පසුගිය ජනවාරි මස 3 වෙනි දින කොළඹදී දොරට වඩනා ලද්දේය. ලේඛකයන් විද්වතුන් හා විවිධ කලාකරුවන් රාශියක් මෙම උත්සවයට පැමිණ සිටි අතර විශේෂ ආරාධිත අමුත්තා වූයේ ප්‍රවීන ලේඛක කේ. ජයතිලක මහතාය. දොරට වැඩීම සිදුවූයේ නුගේගොඩ සරසවි පොත්හලට අයත් ශ්‍රවනාගාරයෙහි දී ය.


උත්සවයට රැස්ව රැස්ව සිටි විද්වතුන් අතර ශ්‍රීජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය රත්නසිරි අරංගල, ආචාර්ය අමර හේවා මද්දුම, ආචාර්ය ලීල් ගුණසේකර සහ ලේඛක බුද්ධදාස ගලප්පත්ති යන මහත්වරු ද වූහ.



නුගේගොඩ සරසවි පොත්හල අධිපති ප්‍රේමසිරි මහතා උත්සවයේ පහන දල්වයි. වම්පසින් පද්මා කුරුප්පු මහත්මියද, අමර හේවා මද්දුම, කේ ජයතිලක සහ බුද්ධදාස ගලප්පත්ති යන මහත්වරු මෙහි වෙති.

සත්‍යාංගනා පද්මා කුරුප්පුගේ තුන්වන නවකතාවයි. මෙයට පෙර ඇය විසින් පළකරන ලද **මද්දුමී** සහ **චූල බන්ධන** නමැති නවකතාවන්ට ඉමහත් පාඨක ප්‍රතිචාරයක් ලැබිණ.

ශ්‍රීලංකාවේ සිට යුරෝපයට යුනෙස්කෝ ආයතනයේ රැකියාවක් සඳහා පැමිණෙන සත්‍යාංගනා නම් යුවතිය මුහුණ




පාන සංස්කෘතිමය හා සමාජීය වෙනස්කම් තුළින් ඇය ජීවිතය සකසාගන්නටත් යථාර්ථයට මුහුණ දෙන්නටත් ගන්නා වෙහෙස මෙම නවකතාවෙන් පද්මා ඉතා විචිත්‍රව දක්වයි. එමෙන්ම සැබෑ ප්‍රේමය හමුවේ සියළු දේ පසෙකලා පරිත්‍යාග මූලිකව කටයුතු තරුණ පෙළ කෙරෙහි කතුවරිය පාඨක සහෘද සන්ථානයන් තුළ ගෞරවණීය හැඟීමක් ඉතිරි කරයි.

නවකතා රචනයට මෙන්ම කාව්‍යකරණයටද එකසේ කුසලතා ඇති පද්මා කාව්‍ය සංග්‍රහයන් දෙකක් මින් ඉහත පළකර තිබේ. **කවියෙන් පිරූ පාරමීදම්** සහ **ප්‍රේමය හා ශෝකය** එකී කාව්‍ය ප්‍රබන්ධයෝ වෙති.

## උපන්දින සුබ පැතුම් !



මේ නොබෝ දා පස්වෙනි වියට පා තැබූ **සසිත් දසනායක** අප ආදරණීය පුංචි පුතාට තෙරුවන් සරණින් වාසනාවන්ත අනාගතයකට සුබාසිරි පතනු ලබන්නේ ලන්ඩනයේ ආදරණීය අත්තා ඇතුළු පවුලේ සියළු දෙනාත්, ගිරිහාගම අත්තා සහ එම පවුලේ සැවොමත් සමග අත්තම්මාත් අම්මත් අප්පච්චිත් විසිනි.

Srilanka Information Site ශ්‍රී ලංකා තොරතුරු අඩවිය
www.srilankans.com